

# නපුරු සිහින

දිනුක හිරුෂාන්

විතානගේ
ප්‍රකාශන

1975 වසරේදී යුනිටි ෆීල්ඩ්ස් නමින් හැඳින්වෙන මානසික රෝහලක ප්‍රතිකාර ලබාගන්නා මනෝ ව්‍යාධි නායක හැරිස්ගේ නියෝගය මත සිරුරට ගිනි දල්වාගෙන මානසික රෝගීන් සමූහයම සියදිවි නසා ගනී. අවුරුදු දහතුනක් තිස්සේ කෝමා තත්වයේ පසුවුවද, ගින්න හටගන්නා අවස්ථාවේ සින්තියා නම් එක් තරුණියක් පමණක් මරණයට පත් නොවී ඉතිරිව සිටියි.




සිහිසුන්ව සිටි ඇයට නැවතත් සිහිය එළැඹුනු පසු යුනිටි ෆීල්ඩ්ස් හි ඇගේ ළමා කාලයේ බිහිසුණු අත්දැකීම් වලින් පීඩා විඳි ආකාරය මනසෙහි දිගහැරෙන්නට වේ. වෛද්‍ය ඇලෙක්ස් කර්මන්ගේ නායකත්වයෙන් යුත් රෝහලේ කණ්ඩායමක් පෞරුෂ ආබාධ වලින් පෙළෙන පුද්ගලයන් බලහත්කාරයෙන්ම විවිධ චිකිත්සක පර්යේෂණ සඳහා යොමු කරනු ලබයි.



හෞතීස්ම උත්සවයකදී තවත් මානසික රෝගියෙකු වන ලනා දියේ ගිලී මිය යන බව දුටු දර්ශනයකින් සින්තියා කලබලයට පත්ව සිටී. ටික වේලාවකට පසු, ලනා පිහිනුම් තටාකයක දියෙහි ගිලී මියගොස් ඇති බව ඇයට සියැසින්ම දැකගැනීමට ලැබේ. සින්තියාගේ දර්ශන වඩාත් විචිත්‍රවත් වන අතර මනෝ ව්‍යාධි රෝගීන්ගේ නායකයා වූ හැරිස් ඇගේ මස් පුළුස්සා දමන අයුරු ද ඇයට සිහිනයෙන් පෙනෙන්නට පටන් ගනී.



ඇගේ නේවාසික මිතුරිය වන මීරියම් රෝහලෙන් පිටව ගිය විට, සින්තියාට මීරියම් සමඟ සෝපානයක් මත ලිංගිකව හැසිරෙන්නට උත්සාහ ගන්නා හැරිස් පිළිබඳ දර්ශනයක් මැවේ.කෙසේ වෙතත් සින්තියා ඇයට අනතුරු ඇඟවීමට පෙර දොරවල් වසා දැමූ මීරියම් රෝහලෙන් පිටත්ව ගොස් ඇත.පසුදා අලුයම මීරියම් රෝහලෙහි ඉදිරිපස ජනේලයකින් පැන සියදිවි නසා ගෙන තිබියදී මිරියම්ගේ සිරුර රෝහල ඉදිරිපිට පදික වේදිකාවේ  තිබී සොයාගනු ලැබේ.



රෝහලෙහි වෛද්‍යවරයෙකු වන වෛද්‍ය බෙරිස්ෆර්ඩ් හිතාමතාම චිකිත්සක කණ්ඩායම ලෙස මානසික රෝගීන් යොදගනිමින් විෂ සහිත ඖෂධ රෝගීන් හට ලබා දී ඇති බවත් එම ඖෂධ රෝගීන් සියදිවි නසා ගැනීමට පෙළැඹීම් වී ඇති බව යන කරුණු වෛද්‍ය කර්මන් විසින් සොයාගනු ලබයි.



වෛද්‍ය කර්මන් සින්තියා පර්යේෂණ සඳහා යොදාගනිමින් ඇගේ දර්ශන අවධාරනය කරයි. සින්තියාගේ මනසෙහි මැවෙන හැරිස්ගේ දර්ශන සැබෑ ඒවා නොවන බව එම පර්යේෂණ මගින් ගම්‍ය වේ.එමෙන්ම සින්තියාගේ මනස බෙරිස්ෆර්ඩ්ගේ ඖෂධ මගින් තවත් විකෘති වී ඇති බව තහවුරු වේ.



සින්තියා වහලයට පැන සියදිවි නසාගැනීමට යන අතර එහිදී වෛද්‍ය කර්මන් ඇය ඉණිමගෙහි සිටගෙන සිටිනු දකියි. වෛද්‍ය කර්මන්ට නොපෙනෙන හැරිස්ගේ ආත්මය සින්තියාට වහලයෙන් බිමට පනින්න යනුවෙන් ඉල්ලා සිටින අයුරු නැවතත් සින්තියාගේ මනසෙහි මැවෙන්නට විය.සින්තියාට වහලෙන් බිමට පැනීමෙන් වළකින ලෙස පවසමින් වෛද්‍ය කර්මන් හඬ නගන්නට වූයේය.



මේ අතර වෛද්‍ය කර්මන් තම කුමන්ත්‍රණය සොයාගෙන ඇති බව දැනගත් බෙරිස්ෆර්ඩ් වහලයටද ගොස් වෛද්‍ය කර්මන්ව තල්ලු කර මරා දැමීමට උත්සාහ කරයි. රෝහල් ආරක්ෂාවට සිටි ආරක්ශක නිලධාරීන්ගේ පැමිණීම ඔහුගේ උත්සාහය ව්‍යර්ථ කරන අතර බෙරිස්ෆර්ඩ් අවධාරනය කරන්නේ රෝගීන්ගේ ඖෂධ වෙනස් කිරීම සඳහා වෛද්‍ය කර්මන් වගකිව යුතු බවයි.



බෙරිස්ෆර්ඩ් තම කබායෙන් රිවෝල්වරයක් ඇද ගෙන කර්මන් ඉලක්ක කරගනිමින් වෙඩි තැබීමට සැරසෙයි.නමුත් ඔහුට වෙඩි තැබීමට පෙර සින්තියා බෙරිස්ෆර්ඩ් රෝහල් ගොඩනැගිල්ලෙන් පහලට තල්ලු කරයි.



# නපුරු සිහිණ

